# ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 26 දරන රත්නපුර ශ්‍රී සුමන බෞද්ධ සංගමය පනත

[සහතිකය සටහන් කළේ 1975 ජූලි මස 17 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

(1975 අගෝස්තු මස 15 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී).

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබා ගත හැකිය.

**ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 26 දරන**
**රත්නපුර ශ්‍රී සුමන බෞද්ධ සංගමය පනත**

[සහතිකය සටහන් කළේ 1975 ජූලි මස 17 වන දින]

එල්. ඩී.—ඕ. 57/74

**රත්නපුර ශ්‍රී සුමන බෞද්ධ සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

"රත්නපුර ශ්‍රී සුමන බෞද්ධ සංගමය" යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන සංගමයක්, එකී සංගමයේ සාමාජිකයන් එකඟ වන රීති අනුව එකී සංගමයට සම්බන්ධ සියලු කරුණු ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ හා කරගෙන යාමේ කාර්යය සඳහා රත්නපුරයෙහි මෙතෙක් කල් පිහිටුවා තිබූ හෙයින් ද : පූර්විකාව.

එකී සංගමය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කරුණු සඳහා ද ඒ පරමාර්ථ හා කරුණු එකී සංගමය විසින් මේ දක්වා සාර්ථක ව ක්‍රියාත්මක කර හා කරගෙන ගොස් ඇති හෙයින් සහ එම සංගමය සංස්ථාගත කරනු ලැබීමට ඉල්ලුම් කර ඇති හෙයින් ද එකී ඉල්ලීම ඉෂ්ට කිරීම මහාජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

1\. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 26 දරන රත්නපුර ශ්‍රී සුමන බෞද්ධ සංගමය පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2\. මේ පනත ආරම්භ වීමේ දින සිට හා ඉන් පසු, මෙහි මින් මතු "සංගමය" යනුවෙන් සඳහන් කරනු ලබන රත්නපුර ශ්‍රී සුමන බෞද්ධ සංගමයේ තත්කාලයෙහි සිටින සභාපති, උප සභාපති හා විධායක කාරක සභාවේ සාමාජිකයෝ ද එකී රත්නපුර ශ්‍රී සුමන බෞද්ධ සංගමයේ සාමාජිකයන්ව දැනට සිටින සියලු තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කෙරෙන සංස්ථාවට මින් මතු ඇතුළත් කර ගනු ලබන සාමාජිකයෝද "රත්නපුර ශ්‍රී සුමන බෞද්ධ සංගමය" යන නාමය හා අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාවක් වන්නාහ. එය විසින් හා එයට විරුද්ධව එකී නාමයෙන් සියලු අධිකරණයන්හි නඩු පැවරීම හා නඩු පවරනු ලැබීම කළ හැකි ය. තව ද එකී නාමයෙන් පොදු මුද්‍රාවක් ඇතිව සිටීමේ, පාවිච්චි කිරීමේ හා සංස්ථාවේ අභිමතය පරිදි එය වෙනස් කිරීමේ පූර්ණ බලය හා අධිකාරය එයට ඇත්තේ ය. රත්නපුර ශ්‍රී සුමන බෞද්ධ සංගමය සංස්ථාගත කිරීම.

3\. සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ මෙහි ප්‍රකාශිත පොදු පරමාර්ථයන් උදෙසා වේ :— සංස්ථාවේ පොදු පරමාර්ථ.

(අ) රත්නපුරයේ ශ්‍රී සුමන පිරිවෙන හා එයට අනුබද්ධ ආයතන පාලනය කිරීම සහ දියුණු කිරීම ;

(ආ) බුද්ධ ශාසනයේ අභිවෘද්ධිය උදෙසා ක්‍රියා කිරීම ;

(ඇ) අධ්‍යාපනික සහ වෙනත් සමාජ ශුභ සාධක ව්‍යාපාරයන් ආරම්භ කිරීම ; සහ

(ඈ) ජාතික සහ සංස්කෘතික වැඩ කටයුතු කිරීම.

2—ජ 08656—9,175 (74/08)

විධායක කාරක සභාව.

4. (1) සංස්ථාවේ වැඩ කටයුතු පාලනය විය යුත්තේ සංස්ථාවේ අනුශාසකවරුන්, සභාපති, උපසභාපතිවරුන් පස්දෙනකු, ප්‍රධාන ලේකම්, සංවිධායක ලේකම්, භාණ්ඩාගාරික සහ තත් කාලයෙහි සංස්ථාවේ බලපවත්නා රීති අනුව තෝරා පත්කර ගන්නා ලද වෙනත් පුද්ගලයන් සංඛ්‍යාවකගෙන් සමන්විත වූ විධායක කාරක සභාවක් විසින් දැනට බල පවත්නා සංස්ථාවේ රීතිවලට යටත්ව ය.

(2) සංස්ථාවේ සියලු ම සාමාජිකයන් තත්කාලයෙහි බලපවත්නා සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

(3) මෙම පනත ආරම්භ වන දිනයෙහි සංගමයේ කාරක සභාවේ ධුර දරන අනුශාසකවරු, සභාපති, උපසභාපතිවරු, ප්‍රධාන ලේකම්, සංවිධායක ලේකම්, භාණ්ඩාගාරික සහ වෙනත් සාමාජිකයන්ගෙන් සංස්ථාවේ පළමුවන විධායක කාරක සභාව සමන්විත වන්නේ ය.

රීති සෑදීමේ බලය.

5. සංස්ථාව විසින් කලින් කල යම් මහා සභා රැස්වීමක දී වැඩි ඡන්ද සංඛ්‍යාවකින්, සාමාජිකයන් ඇතුළත් කිරීම, අස්වී යාම හෝ නෙරපීම ද විධායක කාරක සභාවේ වැඩ කටයුතු සහ සංස්ථාවේ නොයෙකුත් නිලධරයන්ගේ සහ නියෝජිතයන්ගේ සහ සේවකයන්ගේ වැඩ කටයුතු කිරීම ද පිළිබඳව සහ සංස්ථාවේ කටයුතු කිරීමේ කාර්ය පටිපාටිය නැතහොත් පොදු වශයෙන් සංස්ථාවේ කට යුතු පාලනය කිරීම පිළිබඳව ද එහි පරමාර්ථයන් මුදුන්පත් කර ගැනීම පිළිබඳව ද තත් කාලයේ බලපවත්නා රීතිවලට යටත්ව රීති සෑදීම නීත්‍යානුකූල විය යුතු අතර, 7 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව මහා සභා රැස්වීමක දී එකී රීති සංශෝධනය කිරීම හෝ ප්‍රත්‍යාදිෂ්ට කිරීම හෝ ඒවාට යමක් එකතු කිරීම ද කළ හැකි ය.

උපලේඛනයේ ඇතුළත් රීති, සංස්ථාවේ රීති විය යුතු බව.

6. 5 වන වගන්තියේ විධිවිධානයන්ට යටත්ව මෙම පනතේ උපලේඛනයෙහි දක්වා ඇති රීති සෑම කාර්යයක් සඳහා ම සංස්ථාවේ රීති වශයෙන් සැලකිය යුතු ය :

එසේ වුව ද සංස්ථාව විසින් මහා සභා රැස්වීමක දී අලුත් රීති සෑදීම හෝ උපලේඛනයේ සඳහන් රීති සංශෝධනය කිරීම, ඒවාට යමක් එකතු කිරීම හෝ ඒවා ප්‍රත්‍යාදිෂ්ට කිරීම මේ වගන්තියේ අඩංගු කිසිවකින් වැළැක්වෙතැයි සැලකීම හෝ තේරුම් ගැනීම නොකළ යුතු ය.

රීති සංශෝධනය සඳහා ක්‍රියා පටිපාටිය.

7. මෙම පනතේ උපලේඛනයෙහි ඇති කිසිම රීතියක් හෝ මෙයින් පසු මහා සභා රැස්වීමක දී සම්මත කරනු ලබන කිසියම් රීතියක් සංශෝධනය කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ එය ප්‍රත්‍යාදිෂ්ට කිරීම සංස්ථාවේ මහා සභා රැස්වීමකට සහභාගි වී ඡන්දය ප්‍රකාශ කළ සාමාජිකයන්ගේ ප්‍රමාණයෙන් තුනෙන් දෙකකට නො අඩු සංඛ්‍යාවකගේ ඡන්දයෙන් හැර නොකළ යුතු ය.

සංගමයෙන් ගෙවිය යුතු හා සංගමයට අයවිය යුතු ණය.

8. මේ පනත ක්‍රියාත්මක වන අවස්ථාවෙහි පවත්නා සංගමයේ සියලු ම ණය හා බැරකම් සංස්ථාව විසින් ගෙවනු ලැබිය යුතු අතර, සංගමයට අය විය යුතු සියලු ම ණය හා සංගමයට ගෙවිය යුතු සියලු ම ආධාර මුදල් හා දායක මුදල් මේ පනතේ කාර්යයන් සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

පාලක මණ්ඩලය.

9. (1) පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත වූ පාලක මණ්ඩලයක් විය යුතු ය. එනම් :—

(අ) එවකට වැඩ වසන රත්නපුර ශ්‍රී සුමන පිරිවෙන් විහාරයේ විහාරාධිපති ;

(ආ) රත්නපුර ශ්‍රී සුමන පිරිවෙනෙහි එවකට සිටින පරිවේණාධිපති ;

(ඇ) රත්නපුර ශ්‍රී සුමන පිරිවෙනෙහි ආචාර්යවරයන් විසින් තෝරා පත්කර ගන්නා ලද එම පිරිවෙනෙහි අනුමත ආචාර්යවරුන් දෙදෙනෙක් ;

(ඈ) සංස්ථාවේ මහා සභා රැස්වීමක දී තෝරා පත්කර ගන්නා ලද සංස්ථාවේ නියෝජිතයන් තිදෙනෙක් ; සහ

(ඉ) පූර්වෝක්ත පිරිවෙනෙහි ඇදි ශිෂ්‍ය සංගමයෙහි රැස්වීමක දී තෝරා පත්කර ගන්නා ලද ආදි ශිෂ්‍යයන්ගේ නියෝජිත වරුන් දෙදෙනෙක්.

(2) පිරිවෙනෙහි පරිවේණාධිපති පාලක මණ්ඩලයේ ලේකම් විය යුතු ය.

(3) නිල බලයෙන් ධුර දරන්නවුන් හැර පාලක මණ්ඩලයේ සෑම සාමාජිකයකුම පස් අවුරුදු කාල සීමාවකට පත් කළ යුතු අතර නැවත පත් කිරීමට සුදුස්සකු විය යුතු ය.

පාලක මණ්ඩලයේ බලතල.

10. (1) රුපියල් එක් දහස ඉක්මවා යන වැය කිරීමක් නැත හොත් බද්දක්, කුලියට දීමක්, බදු දීමක්, උකසක්, විකිණීමක්, මිලට ගැනීමක් හෝ ත්‍යාගයක් වශයෙන් වූ හෝ අන් ආකාරයක වූ හෝ යම් කිසි දේපළ බැහැර කිරීමක් ඒ වැය කිරීම හෝ බැහැර කිරීම සඳහා පාලක මණ්ඩලයේ පූර්ව අනුමතය ලැබී ඇතහොත් මිස වලංගු නොවන්නේ ය.

(2) විධායක කාරක සභාවට සංස්ථාව වෙනුවෙන් ණයට ගැනීමේ බලය පාවිච්චි කළ හැක්කේ පාලක මණ්ඩලයේ අනුමතය ඒ සඳහා ලබා ඇතහොත් පමණ ය.

සංස්ථාවේ මුද්‍රාව.

11. සභාපති සහ ප්‍රධාන ලේකම් හෝ භාණ්ඩාගාරික යන විධායක කාරක සභාවේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී මිස සංස්ථාවේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට තබනු නොලැබිය යුතු ය. එකී සාමාජිකයන් දෙදෙනා තමන් පැමිණ සිටි බවට සාක්ෂි වශයෙන් එකී ලේඛනයෙහි තම නම් අත්සන් කළ යුතු අතර එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට බාහිරව විය යුතු ය.

දේපළ සතුව සිටීමට සංස්ථාව සතු බලය.

12. යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, අන්තිම කැමති පත්‍රයකින් මුදල් බැහැර කිරීමක් ප්‍රකාර හෝ අන් ආකාරයකින් සංස්ථාව සතු වන යම් චංචල හා නිශ්චල දේපළක් භාර ගැනීමටත් සතුව සිටීමටත් නීතිය අනුව සංස්ථාවට හැකියාව හා ශක්නුතාව ඇත්තේ ය. තව ද එකී සියලු දේපළ ඒවා විකිණීමේ, උකස්

කිරීමේ, බද්දට දීමේ, හුවමාරු කර ගැනීමේ හා අන් ආකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය ඇතිව, මේ පනතේ කාර්යයන් සඳහා සහ සංස්ථාවේ තත්කාලයෙහි බලපවත්නා රීතිවලට යටත්ව, සංස්ථාව සතුව තබා ගත යුතු ය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**13.** මේ පනතෙහි සඳහන් තැනැත්තන්ගේ හා ඔවුන් මගින්, ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන්නවුන්ගේ අයිතිවාසිකම්වලට හැර, ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙන යම් තැනැත්තන්ගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවන්නේ ය.

### උපලේඛනය

නාමය.

1. සංගමයේ නාමය රත්නපුර ශ්‍රී සුමන බෞද්ධ සංගමය වන්නේ ය.

පරමාර්ථ.

2. (අ) රත්නපුර ශ්‍රී සුමන පිරිවෙන හා ඊයට අනුබද්ධ ආයතන පාලනය කිරීම සහ දියුණු කිරීම;

(ආ) බෞද්ධ ශාසනයේ අභිවෘද්ධිය උදෙසා ක්‍රියා කිරීම;

(ඇ) අධ්‍යාපනික සහ වෙනත් සමාජ සුභසාධක ව්‍යාපාරයන් ආරම්භ කිරීම; සහ

(ඈ) ජාතික හා සංස්කෘතික වැඩ කටයුතු කිරීම

සංගමයේ පරමාර්ථයන් වන්නේ ය.

සංගමයේ බලතල.

3. ඉහත සඳහන් යම් පරමාර්ථයක් හෝ ඊට වැඩි ගණනක් මුදුන්පත් කර ගැනීම සඳහා චංචල හෝ නිශ්චල දේපළ අත්කර ගැනීමට සහ එකී දේපළ ඇපයට තැබීමෙන් හෝ අන්‍යාකාරයෙන් ණය ලබා ගැනීමේ බලය සංගමයට ඇත්තේ ය.

සාමාජිකත්වය.

4. වයස අවුරුදු 18 ත් ඉහළ සියලුම බෞද්ධයන්ට සංගමයේ සාමාජිකත්වය ලැබිය හැකි ය.

සාමාජිකයන්ගේ වර්ගයන්.

5. (1) සංගමයේ සාමාජිකයෝ තුන් වගියක් වන්නාහ. එනම්:—

(අ) ගරු යාවජීව සාමාජිකවරු;

(ආ) යාවජීව සාමාජිකවරු; සහ

(ඇ) සාමාන්‍ය සාමාජිකවරු.

(2) ගරු යාවජීව සාමාජිකවරුන්, විධායක කාරක සභාව මගින් තෝරා පත් කර ගනු ලබන තැනැත්තන් විය යුතු අතර ඒ තැනැත්තන්—

(අ) රත්නපුර ශ්‍රී සුමන පිරිවෙන දියුණු කිරීමේ කාර්යයෙහි ලා නියම වශයෙන් සහභාගි වූ භික්ෂූන් වහන්සේලා; හෝ

(ආ) රත්නපුර ශ්‍රී සුමන පිරිවෙනට හෝ සංගමයට, විශිෂ්ට සේවාවක් කළ ගිහි බෞද්ධයන් හෝ

විය යුතු ය.

(3) යාවජීව සාමාජිකයන් වශයෙන් තෝරා පත් කර ගැනීම සඳහා ඉල්ලුම් පත් විධායක කාරක සභාව වෙත ඉදිරිපත් කරනු ලැබ ඒ ඉල්ලුම්පත් විධායක කාරක සභාව විසින් අනුමත කරනු ලැබ ඇති තැනැත්තෝ යාවජීව සාමාජිකයෝ වන්නාහ.

(4) අන් සියලුම සාමාජිකයන් සාමාන්‍ය සාමාජිකයන් විය යුතු ය.

සාමාජිකයන් වශයෙන් තෝරා පත් කිරීම.

6. (1) (අ) විධායක කාරක සභාව විසින් අනුමත කරන ලද ආකෘති පත්‍රයේ තෝරා පත් කර ගැනීම සඳහා යම් තැනැත්තකු විසින් ඉදිරිපත් කරනු ලබන ඔහුගේ ඉල්ලුම්පත්‍රය මත, සහ

(ආ) මේ රීති අනුව ගෙවිය යුතු දායක මුදල් ගෙවීමෙන්

සංගමයේ සාමාජිකත්වය ලැබීමට සුදුසුකම් ඇති තැනැත්තකු සාමාජිකයකු වශයෙන් විධායක කාරක සභාව මගින් තෝරා පත් කරනු ලැබිය හැකි ය.

(2) විධායක කාරක සභාව විසින් හේතු නොදක්වා ඉල්ලුම්පතක් ප්‍රතික්ෂේප කළ හැකි ය.

දායක මුදල්.

7. (1) ගරු සාමාජිකයෙක් දායක මුදලක් ගෙවීමට යටත් නොවන්නේ ය.

(2) ජීවිත සාමාජිකයෙක් රු. 250 ක දායක මුදලක් ගෙවිය යුතු ය.

(3) සාමාන්‍ය සාමාජිකයකු එක් එක් වර්ෂයේ මාර්තු 31 වන දිනට කලින් රු. 5 වාර්ෂික දායක මුදලක් ගෙවිය යුතු අතර එසේ නොගෙවුවහොත්, එදිනට පසු ඔහු දායක මුදල් හිඟ තබා ඇත්තකු සේ සැලකිය යුතු ය.

සාමාජිකයන්ගේ බලතල සහ වරප්‍රසාද.

8. දායක මුදල් හිඟ තබා ඇති කිසිම සාමාජිකයකු සාමාජිකත්වයට හිමි යම් බලතල හෝ වරප්‍රසාද කිසිවක් ක්‍රියාත්මක කිරීමට හෝ භුක්ති විඳීමට හිමිකම නොලැබිය යුතු ය.

සාමාජිකත්වය අවසන් වීම.

9. (1) පහත සඳහන් හේතු අතුරෙන් යම් හේතුවක් හෝ ඊට වැඩි ගණනක් නිසා සාමාජිකත්වය අවසන් විය යුතු ය:—

(අ) සාමාජිකයකු මිය යාම;

(ආ) සිය සාමාජිකත්වයෙන් ඉල්ලා අස්වීම;

(ඇ) මෙම රීති යටතේ නෙරපා හැරීම;

(ඈ) මෙම රීතිවල සලස්වා ඇති විධිවිධාන අනුව යථා පරිදි දැනුම් දීමෙන් පසු හිඟ දායක මුදල් නොගෙවීම හේතු කොට ගෙන සාමාජික ලැයිස්තුවෙන් නම කපා හැරීම.

(2) (අ) යම් වර්ෂයක ජූනි 30 වන දින වන විට හිඟ දායක මුදල් ගෙවිය යුතුව ඇති සෑම සාමාජිකයකුට ම ඒ බව ප්‍රධාන ලේකම් විසින් ලියාපදිංචි තැපැලෙන් දන්වා යැවිය යුතු ය.

(ආ) එවැනි සෑම දැන්වීමක ම එම දැන්වීම නිකුත් කළ දින සිට මාස දෙකකට නොඅඩු දිනයක් සඳහන් විය යුතු අතර, එම දිනය වන විට හිඟ දායක මුදල් නොගෙවා ඇතොත් වැඩිදුර දැනුම් දීමක් නොමැතිව විධායක කාරක සභාව විසින් ප්‍රස්තුත සාමාජිකයාගේ සාමාජිකත්වය අවසන් කළ හැකි අතර සාමාජික ලැයිස්තුවෙන් ඔහුගේ නම කපා හරින ලෙස නියම කළ හැකි ය.

විනයානුකූල ක්‍රියා කිරීම.

10. (1) සංගමයේ පරමාර්ථයන්ට පටහැනිව ක්‍රියා කරන හෝ සංගමයේ වැඩ කටයුතුවලට බාධා කරන හෝ ඔහුගේ ක්‍රියා කලාපය හේතු කොටගෙන සංගමය අපකීර්තියට පත් නොට ඇතැයි සැලකිය හැකි යම් සාමාජිකයකුගේ සාමාජිකත්වය තාවකාලික ලෙස අත්හිටුවීමේ බලය විධායක කාරක සභාව සතු වන්නේ ය.

(2) එවැනි යම් සාමාජිකයකු නෙරපීම සඳහා සංගමයේ මහා සභා රැස්වීමක දී විධායක කාරක සභාව විසින් සංගමයට නිර්දේශ කළ හැකි ය.

(3) මහා සභා රැස්වීමක දී සාමාජිකයකු සංගමයෙන් නෙරපා දැමිය හැකි අතර එසේ කළ හැක්කේ ඔහුට විරුද්ධව නගන ලද යම් චෝදනාවකට පිළිතුරු දීමට සාමාජිකයාට අවස්ථාවක් ලබාදීමෙන් පසුව පමණකි.

අනුශාසකවරු.

11. (1) රත්නපුර ශ්‍රී සුමන පිරිවෙන් විහාරයේ එවකට සිටින විහාරාධිපති සහ රත්නපුර ශ්‍රී සුමන පිරිවෙනෙහි පරිවේණාධිපති නිලබලයෙන් සංගමයේ අනුශාසකවරු වන්නාහ.

(2) බෞද්ධාගමෙහි හෝ පිරිවෙනෙහි අභිවෘද්ධිය උදෙසා කරන ලද විශිෂ්ට හෝ ප්‍රශංසනීය සේවය වෙනුවෙන් නිල බලයෙන් පත්වන අනුශාසකවරුන් දෙදෙනාට අමතරව වෙනත් බෞද්ධයන් අනුශාසකවරුන් වශයෙන් තෝරා පත් කර ගැනීමට සංගමයට බලය තිබිය යුතු ය.

නිලධරයන් සහ ඔවුන් තෝරා පත් කරනු ලබන අන්දම.

12. (1) සංගමයේ නිලධරයන් විය යුත්තෝ—

(අ) සභාපති කෙනෙක්,

(ආ) උප සභාපතිවරුන් පස් දෙනෙක්,

(ඇ) ප්‍රධාන ලේකම්වරයෙක්,

(ඈ) සංවිධායක ලේකම්වරයෙක්,

(ඉ) භාණ්ඩාගාරිකවරයෙක්.

යන මොවුහු ය.

(2) (අ) කවර ධුරයක් සඳහා වුව ද නිලධරයන් තෝරා පත් කර ගැනීම වාර්ෂික මහා සභා රැස්වීමක දී හෝ විශේෂ මහා සභා රැස්වීමක දී කළ යුතු අතර රැස්වීම පවත්නා දිනයට අඩු වශයෙන් සම්පූර්ණ දින දෙකකට කලින් මෙම රීතිවලට අනුකූලව නාම යෝජනා ඉදිරිපත් කළ තැනැත්තන් අතුරින් ඒ තෝරා පත් කර ගැනීම කළ යුතු ය.

(ආ) පහත සඳහන් කරුණු ඇතුළත් නාම යෝජනා පත්‍රයක් ප්‍රධාන ලේකම් වෙත ලැබී ඇත්තේ නම් ඒ නාම යෝජනා පත්‍රයේ සඳහන් තැනැත්තා යම් ධුරයකට තෝරා පත් කර ගැනීම සඳහා නාම යෝජනා ඉදිරිපත් කළ තැනැත්තකු ලෙස සැලකිය යුතු ය:—

(i) එසේ නම් කරන ලද සාමාජිකයාගේ නම,

(ii) නාම යෝජනා ඉදිරිපත් කර ඇත්තේ යම් ධුරයක් සඳහාද ඒ ධුරය,

(iii) නාම යෝජනා කරනු ලැබීමට කැමැත්ත දක්වන සාමාජිකයාගේ අත්සන,

(iv) නාම යෝජනා කරන සහ ස්ථිර කරන සාමාජිකයන්ගේ නම් සහ අත්සන්, සහ

(v) නාම යෝජනා කරන ලද දිනය.

(ඇ) ඉහත කී පරිදි යම් ධුරයකට නාම යෝජනා ලැබී නැත්තේ නම් මහා සභා රැස්වීමක දී ඕනෑම සාමාජිකයකුගේ නම යෝජනා කොට ස්ථිර කරනු ලැබීමෙන් ඒ සාමාජිකයා ඒ ධුරයට පත් කරනු ලැබිය හැකි ය.

(ඈ) සාමාජිකයන් දෙදෙනකු හෝ ඊට වැඩි දෙනෙකු සමාන ඡන්ද සංඛ්‍යාවක් ලැබීමේ ප්‍රතිඵලයක් වශයෙන් සමාන තත්ත්වයක් ඇති වූ විට කුසපත් ඇදීමෙන් එසේ ඉදිරිපත් වූ සාමාජිකයන් අතුරින් කෙනෙක් ධුරයට පත් කළ යුතු ය.

විධායක කාරක සභාව සහ ක්‍රියාකාරී කාරක සභාව.

13. (1) සංගමයේ විධායක කාරක සභාව අනුශාසකවරුන්, නිලධරයන් සහ වාර්ෂික මහා සභා රැස්වීමක දී හෝ විශේෂ මහා සභා රැස්වීමක දී තෝරා පත් කර ගන්නා ලද සාමාජිකයන් හතළිස් පස් දෙනකුගෙන් සමන්විත විය යුතු ය. විධායක කාරක සභාවේ ගණපූරණය පහළොස් දෙනෙක් විය යුතු ය.

(2) විධායක කාරක සභාව විසින් ඒ කාරක සභාවේ සාමාජිකයන් හය දෙනකු පත් කළ යුතු අතර ඔවුන් නිලධරයන් නවදෙනා සමග ක්‍රියාකාරී කාරක සභාව බවට පත් විය යුතු ය. ක්‍රියාකාරී කාරක සභාවේ ගණපූරණය හත් දෙනකු විය යුතු ය.

(3) විධායක කාරක සභාවට එහි නියියම් කාර්යයන් ක්‍රියාකාරී කාරක සභාව වෙත පැවරිය හැකි ය.

අනුකාරක සභා.

14. (1) විධායක කාරක සභාව විසින් යම් අනුකාරක සභාවක් පත් කළ හැකි අතර, ඒ අනුකාරක සභාවට යම් කටයුත්තක් හෝ කටයුතු පැවරිය හැකි ය.

(2) එවැනි සෑම අනුකාරක සභාවක ම ලේකම් විධායක කාරක සභාවේ සාමාජිකයකු විය යුතු ය.

විධායක කාරක සභාවේ කටයුතු.

15. සංගමයේ වැඩ කටයුතු පිළිබඳ සාමාන්‍ය පාලනය විධායක කාරක සභාව වෙත පැවරිය යුතු ය.

විධායක කාරක සභාවේ රැස්වීම්.

16. (1) විධායක කාරක සභාව යටත් පිරිසෙයින් තෙමසකට වරක් වත් රැස්විය යුතු ය.

(2) විධායක කාරක සභාවේ රැස්වීමක් සඳහා දැනුම් දීම යටත් පිරිසෙයින් දින හතකට පෙර ප්‍රධාන ලේකම් විසින් කළ යුතු ය:

එසේ වුව ද හදිසි අවස්ථාවක දී කෙටිකාලීන දැනුම් දීමකින් සභා රැස්වීමක් කැඳවිය හැකි ය.

අනුශාසකවරු.

17. (1) විධායක කාරක සභාවේ සෑම රැස්වීමකට ම අනුශාසකවරුන්ට ආරාධනා කළ යුතු අතර, සාමාන්‍යයෙන් ඔවුන් ඡන්දය පාවිච්චි නොකළ යුතු ය.

(2) යම් යෝජනාවක් සම්බන්ධයෙන් පක්ෂව හා විපක්ෂව ලැබුණු ඡන්ද සංඛ්‍යාව එක හා සමාන වූ විට අනුශාසකවරුන්ගේ ඡන්දයෙන් තීරණයකට එළඹිය යුතුය.

පාලක මණ්ඩලය.

18. (1) පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත වූ පාලක මණ්ඩලයක් විය යුතු ය:—

(අ) එවකට වැඩ වසන රත්නපුර ශ්‍රී සුමන පිරිවෙන් විහාරයේ විහාරාධිපති හෝ උන් වහන්සේ විසින් නම් කරන ලද්දෙක්.

(ආ) එවකට රත්නපුර ශ්‍රී සුමන පිරිවෙන් පරිවේණාධිපති.

(ඇ) රත්නපුර ශ්‍රී සුමන පිරිවෙනෙහි ආචාර්යවරයන් විසින් තෝරා පත් කර ගන්නා ලද එම පිරිවෙනෙහි අනුමත ආචාර්යවරුන් දෙදෙනෙක්.

(ඈ) සංගමයේ මහා සභා රැස්වීමක දී තෝරා පත් කර ගන්නා ලද සංගමයේ සාමාජිකවරුන් තිදෙනෙක්, සහ

(ඉ) ඉහත කී පිරිවෙනෙහි ආදි ශිෂ්‍ය සංගමයේ රැස්වීමක දී තෝරා පත් කර ගන්නා ලද එම පිරිවෙනෙහි ආදි ශිෂ්‍යයන්ගේ නියෝජිතවරුන් දෙදෙනෙක්.

(2) පිරිවෙනෙහි පරිවේණාධිපති පාලක මණ්ඩලයේ ලේකම් විය යුතු ය.

(3) නිල බලයෙන් පාලක මණ්ඩලයේ සාමාජිකත්වය දරන්නවුන් හැරුණු විට පාලක මණ්ඩලයේ සෑම සාමාජිකයෙක් ම පස් අවුරුදු කාල සීමාවක් සඳහා පත් කරනු ලැබිය යුතු අතර නැවතත් පත් කරනු ලැබීම සඳහා ඔවුහු සුදුස්සන් වන්නාහ.

පාලක මණ්ඩලයේ කටයුතු.

19. (1) රුපියල් එක් දහසකට වැඩි වැය කිරීමක් නැතහොත් බද්දක්, කුලියට දීමක්, බදු ඉඩලක්, උකසක්, විකිණීමක්, මිලට ගැනීමක් හෝ ත්‍යාගයක් වශයෙන් වූ හෝ අන් ආකාරයක වූ හෝ යම් කිසි දේපළ බැහැර කිරීමක් ඒ වැය කිරීම හෝ බැහැර කිරීම සඳහා පාලක මණ්ඩලයේ පූර්ව අනුමතය ලැබී ඇතහොත් මිස වලංගු නොවන්නේ ය.

(2) විධායක කාරක සභාවට සංගමය වෙනුවෙන් ණයට ගැනීමේ බලය පාවිච්චි කළ හැක්කේ පාලක මණ්ඩලයේ පූර්ව අනුමතය ඒ සඳහා ලබා ඇතහොත් පමණි.

විධායක කාරක සභාවේ බලතල.

20. මෙහි මින් ඉහත විධිවිධාන සලසා ඇති පරිදි පාලක මණ්ඩලයේ බලතලවලට යටත්ව විධායක කාරක සභාවට සංගමයේ අරමුදල් සහ දේපළ පාලනය කිරීම හා කළමනාකරණය කිරීම පිළිබඳව සම්පූර්ණ බලය තිබිය යුතු ය.

මහා සභා රැස්වීම්.

21. (1) සංගමයේ වාර්ෂික මහා සභා රැස්වීම සාමාන්‍යයෙන් ජනවාරි මාසයේ පැවැත්විය යුතු අතර, යම් හෙයකින් කිසියම් බලාපොරොත්තු නොවූ හේතුවක් නිසා එම මාසයේ පැවැත්වීමට නොහැකි වුව හොත් එම රැස්වීම ඉන්පසු හැකි පමණ ඉක්මණින් පැවැත්විය යුතු ය.

(2) (අ) විධායක කාරක සභාවේ හෝ ක්‍රියාකාරි කාරක සභාවේ යෝජනාවක් මත, සහ

(ආ) සභාවට ඉදිරිපත් කිරීමට බලාපොරොත්තුවන කටයුතුවල හෝ යෝජනාවේ ස්වභාවය සඳහන් කරමින් ඡන්දය දීමට සුදුසුකම් ඇති සාමාජිකයන් විසිපස් දෙනකුට නොඅඩු සංඛ්‍යාවක් විසින් කරනු ලබන ලිඛිත ඉල්ලීමක් මත,

විශේෂ මහා සභා රැස්වීමක් පැවැත්විය හැකි ය.

මහා සභා රැස්වීමක් ඇතුම් දීම.

22. වාර්ෂික මහා සභා රැස්වීමක් කැඳවීම සඳහා දින දහතරක් ද විශේෂ මහා සභා රැස්වීමක් සඳහා දින හතක් ද කල්දිය යුතු ය.

ගණපූරණය.

23. (1) මහා සභා රැස්වීමක ගණපූරණය තිස් දෙනකු විය යුතු ය.

(2) ගණපූරණයක් නොමැතිවීම නිසා මහා සභා රැස්වීමක් නොපවත්වනු ලබන විටක නැවත රැස්වීමක් කැඳවිය යුතු ය. එසේ කැඳවනු ලබන්නේ වාර්ෂික මහා සභා රැස්වීමක් නම් මාසයක් ඇතුළත කැඳවිය යුතු අතර, විශේෂ මහා සභා රැස්වීමක් නම් දින පසළොවක් ඇතුළත කැඳවිය යුතු ය.

(3) මේ රීතියේ (2) වන ඡේදය යටතේ කැඳවනු ලබන මහා සභා රැස්වීමක් සඳහා ගණපූරණය පසළොවක් විය යුතු ය.

**යෝජනාවක් පිළිබඳව දැනුම් දීම.**

24. (1) වාර්ෂික මහා සභා රැස්වීමේ දී යෝජනාවක් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන යම් සාමාජිකයකු වාර්ෂික මහා සභා රැස්වීමට පෙරාතුවම යෙදෙන දෙසැම්බර් මස 31 වන දිනට ප්‍රථමයෙන් යෝජක වශයෙන් ඔහු ද ඔහුගේ ස්ථිරකරු ද විසින් අත්සන් තැබූ ලියවිල්ලකින් ඒ යෝජනාව පිළිබඳව ප්‍රධාන ලේකම් වෙත දැනුම් දිය යුතු ය.

(2) ප්‍රධාන ලේකම් එවැනි යෝජනාවක් විධායක කාරක සභාව වෙත ඉදිරිපත් කළ යුතු අතර, එය අනුමත කරන ලද්දේ නම් මහා සභා රැස්වීමේ න්‍යාය පත්‍රයට ඇතුළත් කළ යුතු ය.

(3) න්‍යාය පත්‍රයට එසේ ඇතුළත් නොකරන ලද යම් යෝජනාවක් සභාවට ඉදිරිපත් කළ හැක්කේ න්‍යාය පත්‍රයේ ඇතුළත් සියලු ම කටයුතු අවසන් වූවාට පසු සහ සභාවේ අනුමතය ඇතිව පමණකි.

**නිලධරයන්ගේ බලතල.**

25. නිලධරයන් වෙත කටයුතු හා කාර්ය පැවරීමට ද ඔවුන්ගේ වැඩ අධීක්ෂණය කිරීමට ද විධායක කාරක සභාවට බලය ඇත්තේ ය.

**නිලධරයන්ගේ වැඩ තාවකාලිකව නතර කිරීම.**

26. විධායක කාරක සභාව විසින් ඒ කාරක සභාවේ රැස්වීමක දී සම්මත කරන ලද යෝජනාවක් සහ ක්‍රියාකාරී කාරක සභාවේ වාර්තාවක් මත සභාපති සහ යම් උප සභාපතිවරයකු හැර ඕනෑම නිලධරයකුගේ වැඩ තාවකාලිකව නතර කිරීම කළ හැකි ය. එවැනි තාවකාලිකව වැඩ නතර කිරීමක් මසක් ඇතුළත මහා සභා රැස්වීමක් වෙත දැනුම් දිය යුතු අතර, එවැනි නිලධරයකු ධුරයෙන් ඉවත් කිරීමට ඒ රැස්වීමේ දී තීරණය කරනු ලැබුවහොත් එම රැස්වීම පවත්වන දින සිට ඒ නිලධරයා ඒ ධුරය දැරීම අවසන් වන්නේ ය.

**ලේඛනයන්ට අත්සන් තැබීම.**

27. සංගමයේ මුද්‍රාව තැබීම අවශ්‍ය වන ඕනෑම ලියවිල්ලක් සභාපති සහ ප්‍රධාන ලේකම් හෝ භාණ්ඩාගාරික හෝ යන දෙදෙනාගෙන් කෙනකු විසින් අනුඅත්සන් කළ යුතු ය.

**ආරාවුල්.**

28. සංගමයේ වැඩ කටයුතු සම්බන්ධයෙන් පැන නගින යම් ආරාවුලක් ක්‍රියාකාරී කාරක සභාව වෙත යොමු කළ යුතු අතර ක්‍රියාකාරී කාරක සභාවේ තීරණයෙන් අතෘප්තියට පත් යම් පාර්ශ්වයක් වේ නම් එය විධායක කාරක සභාවේ රැස්වීමකට යොමු කළ යුතු ය. එහි තීරණය අවසානාත්මක වන අතර කිසියම් අධිකරණයක් හෝ වෙනත් විනිශ්චය අධිකාරයක් ඉදිරියේ කිසිම සාමාජිකයකුට එයට විරුද්ධත්වය දැක්විය නොහැකි ය.

**රීති සංශෝධනය කිරීම.**

29. මෙම රීතිවලට කරනු ලබන යම් සංශෝධනයක්, ඒවාට කරනු ලබන යම් එකතු කිරීමක් හෝ ඒවා ප්‍රත්‍යාදිෂ්ට කිරීමක් ඒ සංශෝධනය, එකතු කිරීම හෝ ප්‍රත්‍යාදිෂ්ට කිරීම ඇතුළත් යෝජනාවක් යථා පරිදි දැනුම් දෙනු ලැබ මහා සභා රැස්වීමකට පැමිණ ඡන්දය දෙන්නා වූ සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් දෙකකට නොඅඩු සංඛ්‍යාවක් විසින් සම්මත කරනු ලැබුවහොත් මිස වලංගු නොවිය යුතු ය.

**අර්ථ නිරූපණය.**

30. මෙම රීතිවල—

"සංගමය" යන්නෙන් රත්නපුර ශ්‍රී සුමන බෞද්ධ සංගමය අදහස් වේ.

"පිරිවෙන" යන්නෙන් රත්නපුර ශ්‍රී සුමන පිරිවෙන් විහාර භූමියේ පවත්වාගෙන යනු පිරිවෙන අදහස් වේ.

"පරිවේණාධිපති" යන්නෙන් රත්නපුර ශ්‍රී සුමන පිරිවෙන් විහාරයේ විහාරාධිපති විසින් පත් කරනු ලබන රත්නපුර ශ්‍රී සුමන පිරිවෙනෙහි පරිවේණාධිපති අදහස් වේ.